# මිල හා වැටුප්

## මිල

කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයේ 1967 දී සියයට 2·2 ද, 1968 දී සියයට 5·9 ද, ඉහළ නැගීම් අනුව සසඳන කල එය 1969 වසරේදී සියයට 7·4 කින් ඉහළ නැග තිබේ. පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයෙන් පිටස්තර මිල ගණන් ද, 1969 දී සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත. පාරිභෝගික භාණ්ඩයන්හි, අන්තර් භාණ්ඩයන්හි හා ආයෝජන භාණ්ඩයන්හි මිල ඉහළ යෑම් වාර්තා වී ඇත. 1968 දී මිල ඉහල නැගීම් බොහෝ දුරට වසරේ පසු භාගයට සීමා වුවද, 1969 දී වසර මුළුල්ලේම මිල ඉහළ යෑම් සමසේ පැතිර පැවතිණ.

1969 දී මිල ඉහළ යෑමට ඉවහල් වූ සාධක කිහිපයක් දක්විය හැකිය. 1968 මැයි මාසයේදී විදේශ විනිමය හිමිකම් සහතික පත් ක්‍රමය ඇති කිරීමත්, 1968 අගෝස්තු මාසයේදී පිරිවැටුම් බදු වැඩි කිරීමත් නිසා 1969 වසර ආරම්භයේ දී, මිල කෙරෙහි පීඩණයක් ඇති කෙරිණ. ඇතැම් ආනයන භාණ්ඩ හා මෙරට නිෂ්පාදිත භාණ්ඩ කෙරෙහි යටකී ක්‍රියා මාර්ගයන්ගේ බලපෑම් 1969 මුලදී දැනෙන්නට විය. මෙයට හේතු වූයේ එකී බලපෑම් වලට ගොදුරු වූ භාණ්ඩයන් ආනයනයෙහි හා නිෂ්පාදනයෙහි ඇතිවූ පමාවය.

එතෙර පැවති උද්ධමනාත්මක පීඩනයන්හි ප්‍රතිඵලයක් වශයෙන්, සාමාන්‍යයෙන් මි· ර· ගැ· මිල ගණන් ඉහළ නැගීමේ උපනතිය සහ වි· වි· හි· ස· අනුපාතිකය* ඉහළ යාම යන හේතුන් දෙක නිසා, වර්ෂයේ දෙවන භාගයේදී ආනයනය කල භාණ්ඩවලත්, ආනයන ද්‍රව්‍ය වැඩි කොටසක් අන්තර්ගතවන දේශීය වශයෙන් නිෂ්පාදිත භාණ්ඩවලත් මිල ඉහළ නැගිණි. තවද, සමහර නිෂ්පාදිත භාණ්ඩයන් සඳහා 1969 අගෝස්තු මාසයේදී ව්‍යාපාර පිරිවැටුම් බද්ද වැඩි කිරීම ද මිල කෙරෙහි පීඩනයක් ඇති කිරීමට හේතු විය.

නිෂ්පාදනය වැඩිවීම සහ වි· වි· හි· ස· ක්‍රමය යටතේ ආනයන සීමා කිරීම් ලිහිල්වීම යන හේතුන් දෙක නිසා, භාණ්ඩයන් බොහෝ සෙයින් සුලභ වුවද, 1968 දී ඇතිවූ සැලකිය යුතු ආදායම් වර්ධනය, විශේෂයෙන්ම ග්‍රාමීය අංශයේ ඇතිවූ ආදායම් වර්ධනය හේතු කොට ගෙන කලකට පසු උද්ගත වූ ඉල්ලුම් පීඩනයන් ද 1969 දී මිල ගණන් ඉහළ නැංවීමට හේතු වූ බැව් පෙනේ. ඉල්ලුම් පීඩනයක් ඇති නොවූනේ නම්, ඉහත දක්වූ පරිදි භාණ්ඩයන්ගේ ආනයන හා නිෂ්පාදන වියදම් වැඩිවීම සම්පූර්ණයෙන්ම මිලෙහි පිළිබිඹු නොවනු ඇත. 1969 ඔක්තෝබරයේදී, රජයේ සේවකයනට ලබා දුන් වැටුප් වැඩිවීම ද, 1969 අවසාන භාගයේ ඉල්ලුම් පීඩනයන් තිව්‍ර කිරීමට හේතු වන්නට ඇත.

## කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය

පහත දක්වෙන සංඛ්‍යා සටහන 1968 සහ 1969 පැවති අයුරින්, අංශ හා භාණ්ඩ ගණ අනුව වර්ග කොට කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ ත්‍රෛමාසික හා වාර්ෂික සාමාන්‍ය සංඛ්‍යා පිළිබිඹු කරයි.

---

* 1969 ජූනි 18 වැනි දින සිට විදේශ විනිමය හිමිකම් සහතික පත්වල මිල රුපියල් 100/- සහතිකයක් රුපියල් 44 සිට රුපියල් 55 දක්වා වැඩිවිනි.

## 1 වන සංඛ්‍යා සටහන
## කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය 1952 = 100

| වර්ෂය | සියළුම ශීර්ෂ | භාණ්ඩ අනුව | | | | | අංශ අනුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ආහාර | රෙදිපිළි | ඉන්ධන හා එළිය | ගෙවල් කුලී | විවිධ | දේශීය ගණය | ආනයන ගණය | අපනයන ගණය |
| බර | 100·0 | 61·9 | 9·4 | 4·3 | 5·7 | 18·7 | 60 | 35 | 5 |
| **1968** | | | | | | | | | |
| 1 වන කාර්තුව | 118·9 | 118·9 | 116·0 | 100·0 | 101·5 | 130·7 | 119·7 | 116·3 | 140· |
| 2 වන කාර්තුව | 119·5 | 119·5 | 116·4 | 100·7 | 101·5 | 131·6 | 120·7 | 116·0 | 141·1 |
| 3 වන කාර්තුව | 122·2 | 122·0 | 121·3 | 103·1 | 101·5 | 134·3 | 124·7 | 117·4 | 138·3 |
| 4 වන කාර්තුව | 125·3 | 124·5 | 126·6 | 106·0 | 101·5 | 138·1 | 127·6 | 119·5 | 150·2 |
| සාමාන්‍යය | 121·5 | 121·2 | 120·1 | 103·2 | 101·5 | 133·7 | 123·2 | 117·3 | 142·4 |
| **1969** | | | | | | | | | |
| 1 වන කාර්තුව | 127·7 | 125·3 | 129·5 | 118·6 | 104·3 | 143·9 | 130·1 | 121·0 | 159·8 |
| 2 වන කාර්තුව | 129·8 | 127·3 | 130·5 | 122·3 | 109·8 | 145·8 | 133·8 | 122·2 | 150·5 |
| 3 වන කාර්තුව | 130·4 | 126·8 | 130·8 | 129·4 | 109·8 | 148·7 | 135·1 | 123·7 | 132·5 |
| 4 වන කාර්තුව | 134·2 | 132·2 | 132·6 | 129·4 | 109·8 | 150·0 | 138·0 | 127·3 | 150·1 |
| සාමාන්‍යය | 130·5 | 127·9 | 130·9 | 124·9 | 108·4 | 147·1 | 134·2 | 123·6 | 148·2 |
| 1968 ට වඩා 1969 ඉහළ නැගුණු සියයට ගණන | 7·4 | 5·5 | 9·0 | 21·0 | 6·8 | 10·1 | 8·9 | 5·4 | 4·1 |

1967 තෙක් සාපේක්ෂිත වශයෙන් ස්ථාවරව පැවති සියළු භාණ්ඩ දර්ශකය 1968 දී සියයට 5·9 කින්ද, 1969 දී සියයට 7·4 කින්ද ඉහළ නැගිණි. අධිකතම බර තැබීමක් ඇති ආහාර දර්ශකය සියයට 5·5 කින් ඉහළ නැගුණ අතර ගෙවල් කුලී සියයට 6·8 කින්ද, රෙදිපිළි සියයට 9·0 කින්ද, විවිධ භාණ්ඩ 10·1 කින්ද, ඉන්ධන හා එළිය 21·0 කින්ද ඉහළ නැගිණි. ආනයන කරන ලද ඇතැම් ආහාර ද්‍රව්‍ය, එනම් කිරි පිටි, වියලි කහ, උළුහාල්, සියඹලා සහ බටර් (වෙඩරු) වල, මිල සාමාන්‍ය-යෙහි 1969 දී සැලකිය යුතු වැඩිවීමක් (සියයට 10 කට වැඩි) වාර්තා විය. විස්කෝතු, සකසන ලද ආහාර, සිසිල් බීම, විනාකිරි සහ දෙහි වැනි මෙරට නිෂ්පාදිත අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල සාමාන්‍යයන්හි ද කැපී පෙනෙන වැඩිවීමක් 1969 දී දක්නට විය.

උකුකිරි, ගම්මිරිස්, සරක්කු, වියලි ඉඟුරු, පොල් සහ පපඩම් වල මධ්‍යස්ථ මිල වැඩිවීමක් (සියයට 5 සිට සියයට 10 දක්වා) වාර්තා විය. බී. ඕ. පි. තේ, කිරි ආහාර, කුළුබඩු, අබ, සුදුරු, පොල් තෙල්, ක්‍රාෆ්ට් කේජු සහ ජෑම් (මෙරට) ආදියෙහි ද මිල වැඩිවීම් (සියයට 1 සිට සියයට 4 දක්වා) වාර්තා විය. කෙසේ වුවද, ඉහළ නැගුණු දේශීය නිෂ්පාදනය සහ ආනයනයන් හේතු කොට ගෙන සමහර අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල එනම්, වියලි මිරිස්, සුදු ළූණු, බොම්බයි ළූණු, බිත්තර සහ අර්තාපල්වල මිල සීඝ්‍ර ලෙස (සියයට 10 කට වඩා) පහත වැටුණි. 1968 දී හිඟව තිබූ අර්තාපල් සහ වියලි මිරිස් මේ වසර මුළුල්ලේම අඩු මිලට වෙළෙඳ පොලෙන් ලබා ගත හැකි විය.

1968 දී, සියයට 2·9 කින් ඉහළ නැගුන රෙදිපිළි දර්ශකය, බැනියන් සහ තුවා මිල වැඩිවීම හේතු කොට ගෙන 1969 දී සියයට 9·0 කින් ඉහළ නැගුණි. එසේ වුවද අමු රෙදි සහ වේට්ටි වල මිල පහත වැටීමක් වාර්තා විය.

ඉන්ධන හා එළිය සඳහා වූ දර්ශකය 1968 දී ඉහළ නැගි සියයට 6·9 අනුව සසඳන කල මෙවර එය සියයට 21·0 කින් ඉහළ නැග ඇති බැව් පෙනේ. මෙයට එකම හේතුව වූයේ දර වල මිල ඉහළ යෑමය.

දේපල වටිනාකම් වල හා වරිපනම් වල ඇතිවන කාලීන වෙනස්කම් නිසා ගෙවල් කුලී වටිනාකම් වැඩි කිරීමකට ඉඩ සලසනු වස්, 1954 සිට 101·5 හි නොවෙනස්ව පැවති ගෙවල් කුලී සඳහා වූ උප දර්ශකය 1969 මාර්තු මාසයේදී 109·8 සේ ප්‍රතිශෝධනය කරන ලදී. 1969 සඳහා වූ සාමාන්‍ය දර්ශකය, ඉකුත් වසරට වඩා සියයට 6·8 ක වැඩිවීමක් දක්වාලීය.

විවිධ ද්‍රව්‍ය සඳහා වූ දර්ශකයෙහි ඉකුත් වසරේදී ඇතිවූ සියයට 3·6 ක ඉහළ යෑම හා සසඳන කල, එය 1969 දී සියයට 10·1 කින් ඉහළ ගොස් තිබේ. මෙම දර්ශකය 1969 මුළුල්ලේ බොහෝ දුරට නොකඩවාම ඉහළ නැගුණි.

විවිධ ද්‍රව්‍ය ගණයෙහි අන්තර්ගත, බුලත් සහ පුවක්, හිසකේ කැපීම සහ පවිත්‍රෝපකරණ, ලිපි ද්‍රව්‍ය, ඇඳුම් ගාස්තු සහ විනෝද ගාස්තු ආදියෙහි කැපී පෙනෙන මිල වැඩිවීම් ද, (සියයට 10 ට වැඩි) ඖෂධ සහ පුවත් පත් ආදියෙහි මධ්‍යස්ථ වැඩිවීම් ද (සියයට 5 සිට සියයට 10 දක්වා) දුම්කොළ හා මද්‍යසාරවල සුළු වැඩිවීම් ද වාර්තා විය. එසේ වුවද, 1969 දී ලංකා පිඟන් බඩු සංස්ථාවෙහි නිෂ්පාදිතයන් ලබා ගත හැකිවීම නිසා, පිඟන් බඩුවල මිල සුළු වශයෙන් අඩු විණි.

**පාරිභෝගිකයින්ගේ මිල දර්ශකයට ඇතුළත් නොවූ මිල ගණන්**

පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයට ඇතුළත් නොවූ සීමිත ද්‍රව්‍ය සංඛ්‍යාවක මිල දත්තයන් වෙළෙඳුන් විසින් සපයන ලද මිල ලැයිස්තු වලින් ද, කොළඹ නගරයේ සිල්ලර වෙළෙඳුන්ගෙන් කෙළින්ම විමසීමෙන් ද ලබා ගන්නා ලදී. මෙම ද්‍රව්‍ය, පාරිභෝගික, අන්තර් සහ ආයෝජන භාණ්ඩ වශයෙන් පුළුල් ලෙස වර්ග කොට තිබේ.

තෝරා ගත් ද්‍රව්‍ය වල මිල 1968 අවසානය සහ 1969 අවසානය අතරතුර කාලයේදී ප්‍රතිශත වශයෙන් ඉහළ නැගි අයුරු පහත දැක්වෙන සංඛ්‍යා සටහනින් පෙනී යයි.

**2 වන සංඛ්‍යා සටහන**

| භාණ්ඩයේ වර්ගය | වැඩිවීමේ සියයට ගණන 1969/1968 |
|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | |
| පාවහන් ... ... ... ... | 4 – 20 |
| වැක්ස් පොලිස් ... ... ... ... | 14 – 31 |
| මෝටර් රථ අමතර කොටස් ... ... ... | 2 – 39 |
| මහන මැෂින් ... ... ... | 4 – 10 |
| විදුලි බුබුළු ... ... ... | 4 – 23 |
| ඇළුමිනියම් භාණ්ඩ ... ... ... | 12 |
| **අන්තර් භාණ්ඩ** | |
| තඹ කම්බි ... ... ... ... | 30 – 40 |
| සෝඩා අලු ... ... ... ... | 55 |
| **ආයෝජන භාණ්ඩ** | |
| තීන්ත සහ තෙල් වර්ග ... ... ... ... | 10 – 13 |
| ඇස්බැස්ටෝස් නිෂ්පාදන ... ... ... | 3 |
| "තේ" යන්ත්‍ර ... ... ... ... | 2½ |
| විදුලි කේබල් ... ... ... ... | 6 – 20 |
| උදලු ... ... ... ... | 12 |
| පදම් නොකළ වානේ ... ... ... ... | 14 |

1. ඒ ඒ භාණ්ඩ වර්ගයන්ට ඉදිරියෙන් දක්වා ඇති, සියයට ගණන්වල වැඩිවීම් පරාසයන් දක්වන්නේ නියෝජිත භාණ්ඩයන්ගේ සියයට ගණන් වැඩිවීමේ පහළම මට්ටම සහ ඉහළම මට්ටමය.

**පාරිභෝගික භාණ්ඩ**

කොළඹ විවට වෙළඳ පොලේ තම්බාපු සහල් වල වාර්ෂික මිල සාමාන්‍යය, 1968 දීට වඩා සියයට 8 කට ආසන්න වැඩිවීමක් දක්වාලීය. වර්ෂයේ, ආරම්භයේදී හා අවසානයේදී අධිකවත්, මැදදී පහත්වත් පැවති මිල, නො: 1 තම්බාපු සහල් සඳහා සේරුව රු. 1.10 සිට රු. 1.40 දක්වා පරතරයෙහි විය.

පාවහන් සියයට 4–20 දක්වාත්, පොලිෂ් වර්ග සියයට 14–31 දක්වාත්, විදුලි බුබුළු සියයට 4–23 දක්වාත්, ඇලුමිනියම් භාණ්ඩ සියයට 12 කුත්, මෝටර් රථ අමතර කොටස් සියයට 2–39 දක්වාත්, මිල වැඩිවීම් පිළිබිඹු කළ අතර, කල්පවත්නා පාරිභෝගික ගණයේ වූ, මහන මැෂින් වල මිල සියයට 4–10 කින් ඉහළ නැගුණි.

**අන්තර් භාණ්ඩ**

1969 දී පොහොර මිල ස්ථාවරව පැවැති අතර පිත්තල, තඹ, සෝඩා අලු වැනි කර්මාන්ත අමු ද්‍රව්‍ය වල මිල ඉහළ නැග්මක් දක්නට ලැබිණි. තඹ කම්බි වල මිල වැඩිවීම සියයට 35 ක සහ සෝඩා අලුවල මිල වැඩිවීම සියයට 55 ක ප්‍රමාණ තුළ පැවැතිණි.

**ආයෝජන භාණ්ඩ**

සිමෙන්ති සංස්ථාවේ සිමෙන්ති සම්පාදනය ශක්තිමත්ව පැවතීම 1969 තුළදී මෙරට සිමෙන්ති කොට්ටයක මිල රු. 13·25 හි ස්ථාවර මට්ටමේ පැවතීමට ඉවහල් විය. පදම් නොකල වානේ සඳහා සියයට 14 කද, තෙල් සහ තීන්ත සඳහා සියයට 10–13 කද විදුලි කේබල් සඳහා සියයට 6–20 දක්වාද, "තේ" යන්ත්‍ර සඳහා සියයට 2⅓ කද මිල වැඩිවීම් වාර්තා විය.

වැටුප්

රාජ්‍ය අංශයේ නියුතු ශිල්පීය සහ ලිපිකාර සේවකයන්, සුළු සේවකයන් සහ පැසැල් ගුරුවරුන්ගේ වැටුප් අනුපාතික දර්ශකයන් මහ බැංකුව සකස් කරයි. මෙම දර්ශකාංක, නියෝජන ශ්‍රෙණිවල සේවකයන්ට ගෙවිය යුතු දීමනා, මූලික වැටුප් වේතන ආදිය අනුව ගණනය කරන අතර, වාර්ෂික වැඩිවීම් හා අතිකාල දීමනා මෙයට ඇතුලත් කරනු නොලැබේ. පෞද්ගලික අංශයේ වැටුප් මණ්ඩලවලට අයත් කෘෂිකාර්මික, කාර්මික සහ වාණිජ අංශයන්හි නියුතු කම්කරුවන් සඳහා වූ වැටුප් අනුපාතික දර්ශකයන් ද කම්කරු දෙපාර්තමේන්තුව මගින් ප්‍රසිද්ධ කරනු ලැබේ. වැටුප් පාලක සභා මගින් නියම කල අවම වැටුප් හා, 1967 දෙසැම්බර් සිට, අවප්‍රමාණ දීමනා මත, මෙම දර්ශකාංක පදනම් වී ඇත. මෙම දර්ශකාංකයන්ට පදනම් වර්ෂය වනුයේ 1952 වර්ෂයයි.

අතිකාල දීමනා සහ පෞද්ගලික අංශයේ සේවකයින් සම්බන්ධයෙන් සානුබලයන් හෝ පාරිතෝෂික දීමනා වැනි විශේෂ ගෙවීම්, ඇතුළත් වන්නාවූ නියම ඉපැයීම් ඉහත සඳහන් වැටුප් ප්‍රමාණ දර්ශකයන් මගින් නිරූපණය නොවේ. ජීවන වියදම් දර්ශකයෙන්, වැටුප් අනුපාතික දර්ශකයන් අවධමනය කිරීමෙන්, මහ බැංකුව මූර්ත වැටුප් අනුපාතිකයන් හා සම්බන්ධ දර්ශකයන් ගණනය කරනු ලබයි (කොළඹ පාරිභෝගිකයින්ගේ මිල දර්ශකය), පහත දක්වෙන සටහන මගින් 1968 සහ 1969 සඳහා රජයේ සේවකයන්ගේ වැටුප් අනුපාතිකයන්හී වාර්ෂික සහ කාර්තුගත දර්ශකාංක පිළිබිඹු වෙයි.

## I වැනි සංඛ්‍යා සටහන
## රජයේ සේවකයන්ගේ වැටුප් අනුපාතික දර්ශක අංක
## (1952 = 100)

| | ශිල්පි හා ලිපිකාර සේවකයන් | | සුළු සේවකයන් | | රජයේ සේවකයන් (අ) | | රජයේ පාසැල් ගුරුවරුන් | |
|---|---|---|---|---|---|---|---|---|
| | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය |
| **1968** | | | | | | | | |
| පළමු කාර්තුව .. | 140·1 | 117·8 | 163·0 | 137·0 | 152·6 | 128·3 | 129·6 | 109·0 |
| දෙවන කාර්තුව .. | 140·1 | 117·3 | 163·0 | 136·4 | 152·6 | 127·7 | 129·6 | 108·5 |
| තුන්වන කාර්තුව .. | 140·1 | 114·6 | 163·0 | 133·4 | 152·6 | 124·9 | 129·6 | 106·0 |
| සතරවන කාර්තුව .. | 140·1 | 111·9 | 163·0 | 130·1 | 152·6 | 121·9 | 129·6 | 103·5 |
| සාමාන්‍යය .. | **140·1** | **115·4** | **163·0** | **134·2** | **152·6** | **125·7** | **129·6** | **106·7** |
| **1969** | | | | | | | | |
| පළමු කාර්තුව .. | 140·1 | 109·7 | 163·0 | 127·6 | 152·6 | 119·5 | 129·6 | 101·5 |
| දෙවන කාර්තුව .. | 140·1 | 107·9 | 163·0 | 125·5 | 152·6 | 117·5 | 129·6 | 99·8 |
| තුන්වන කාර්තුව .. | 140·1 | 107·5 | 163·0 | 125·0 | 152·6 | 117·0 | 129·6 | 99·4 |
| සතරවන කාර්තුව .. | 157·2 | 117·2 | 182·9 | 136·3 | 171·3 | 127·7 | 141·1 | 105·2 |
| සාමාන්‍යය .. | **144·4** | **110·6** | **168·0** | **128·6** | **157·3** | **120·4** | **132·5** | **101·5** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) ලිපිකාර, ශිල්පීය හා සුළු සේවකයින් සඳහා වූ ඒකාබද්ධ දර්ශකය.

සංලක්ෂ්‍ය: 1959 සැප්තැම්බර් 30 වැනිදට සේවයෙහි යෙදී සිටි සේවකයින් ප්‍රමාණය මත පදනම්ව, නිශ්චිත බර තැබීම් අනුව මෙම දර්ශකාංකයන් ගණනය කර ඇත. දර්ශකාංකයන් ගණනය කිරීමෙදි යොදාගෙන ඇති වැටුප් අනුපාතිකයන් වනුයේ, එක් එක් නියෝජන පරිමාවෙහි වූ මූලික වැටුප් සහ දීමනාවන්ය.

1969 වැටුප් සහ සේවා කොමිෂමේ අතුරු වාර්තාව මගින් නිර්දේශ කල පරිදි, 1969 ඔක්තෝබර් 1 වැනිදා සිට ඒකාබද්ධ වැටුපක් ගෙවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, 1969 තෙවැනි කාර්තුව දක්වා ස්ථාසීව පැවති වැටුප් අනුපාතික දර්ශකයන්, අවසන් කාර්තුවේදී තියුණු ලෙස ඉහළ ගියේය. ශිල් පීය සහ ලිපිකාර සේවකයින් සඳහාවූ දර්ශකය, තෙවැනි කාර්තුවේදී 140·1 න් අවසන් කාර්තුවේදි 157·2 දක්වා වැඩිවූ අතර සුළු සේවකයින් සඳහාවූ දර්ශකය 163·0 සිට 182·9 දක්වාත් රජයේ පැසැල් ගුරුවරුන් වෙනුවෙන් වූ දර්ශකය 129·6 සිට 141·1 දක්වාත් ඉහළ ගියේය. 1968 හා 1969 අතර කාලයේදී ශිල්පීය සහ ලිපිකාර සේවකයන් හා සුළු සේවකයන් සඳහා වාර්ෂික සාමාන්‍ය වැටුප් අනුපාතික දර්ශකයන් සියයට 3·1 කින් හා පාසැල් ගුරුවරුන් සඳහා එය සියයට 2·2 කින්ද ඉහළ නැගිණ.

1969 මුල් කාර්තු තුනේදි රජයේ සේවකයින්ගේ මූර්ත වැටුප් දර්ශකයන් පහත වැටුනි. කෙසේ වුවද, ඒකාබද්ධ වැටුප් ගෙවීම්වලට අනතුරුව ශිල්පීය හා ලිපිකාර සේවකයන් සඳහා මෙම දර්ශකයන්, තුන්වන කාර්තුවේදී 107·5 සිට අවසාන

කාර්තුවේදී 117·2 දක්වාද, සුළු සේවකයන් සඳහා 125·0 සිට 136·3 දක්වාද, පාසැල් ගුරුවරුන් සඳහා 99·4 සිට 105·2 දක්වාද ඉහළ නැගිණ. 1969 මූර්ත වැටුප් පරිමාවන්හි කාර්තුගත දර්ශකයන්, 1968 අනුරූප සංඛ්‍යාවන් හා සසඳන කල පළමු කාර්තු තුනේදී පහළ මට්ටමක පිහිටියද, අවසාන කාර්තුවේදී වඩා උසස් මට්ටමකට පත් විය. මෙම යහපත් තත්වය ඇති වූයේ අවසන් කාර්තුවේදී වූ බැවින්, 1969 වර්ෂය සඳහා වූ වාර්ෂික සාමාන්‍ය මූර්ත වැටුප් අනුපාතික දර්ශකයන්, 1968 දර්ශකයන්ට වඩා පහත් මට්ටමක විය. කාර්මික සහ ලිපිකාර සේවකයන් සඳහා සාමාන්‍ය දර්ශකයන් 1969 දී 110·6 ක්වූ අතර, සුළු සේවකයන් සඳහා 128·6 ද, පාසැල් ගුරුවරුන් සඳහා 101·5 විය. 1968 අනුරූප සංඛ්‍යාවන් 115·4, 134·2 සහ 106·7 විය.

1968 සහ 1969 වර්ෂයන් සඳහා, සමහර පඩිපාලක සභා යටතේ ගැනෙන පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අවම වැටුප් අනුපාතිකයන්හී වාර්ෂික සහ කාර්තුගත දර්ශකාංකයන් පහත දැක්වෙන සංඛ්‍යා සටහනින් පෙන්නුම් කෙරේ.

**2 වැනි සංඛ්‍යා සටහන.**

**වැටුප් පාලක සභා කර්මාන්තයන්හි කම්කරුවන්ගේ අවම වැටුප් අනුපාතික දර්ශක අංක (1952 = 100)**

| | කෘෂිකර්මයෙහි නියුතු කම්කරුවෝ (අ) | | කර්මාන්තයෙහි සහ වාණිජ අංශයේ නියුතු කම්කරුවෝ (ආ) | | කර්මාන්තයන්හි නියුතු කම්කරුවෝ (ඇ) | |
|---|---|---|---|---|---|---|
| | අවම වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් දර්ශකය | අවම වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් දර්ශකය | අවම වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් දර්ශකය |
| 1968 – පළමු කාර්තුව .. | 138·8 | 116·7 | 161·6 | 135·9 | 141·2 | 118·7 |
| දෙවන කාර්තුව .. | 138·8 | 116·2 | 161·6 | 135·3 | 141·2 | 118·2 |
| තුන්වන කාර්තුව .. | 138·8 | 113·5 | 161·6 | 132·2 | 141·2 | 115·5 |
| සතරවන කාර්තුව .. | 138·8 | 110·8 | 161·6 | 129·1 | 141·2 | 112·7 |
| **සාමාන්‍යය ..** | **138·8** | **114·3** | **161·6** | **133·1** | **141·2** | **116·3** |
| 1969 – පළමු කාර්තුව .. | 138·8 | 108·7 | 161·6 | 126·6 | 141·2 | 110·6 |
| දෙවන කාර්තුව .. | 138·8 | 106·9 | 161·6 | 124·5 | 141·2 | 108·7 |
| තුන්වන කාර්තුව .. | 138·8 | 106·4 | 161·6 | 124·0 | 141·2 | 108·3 |
| සතරවන කාර්තුව .. | 138·8 | 103·4 | 161·8 | 120·6 | 141·2 | 105·2 |
| **සාමාන්‍යය ..** | **138·8** | **106·3** | **161·7** | **123·9** | **141·2** | **108·2** |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව සහ කම්කරු දෙපාර්තමේන්තුව.

(අ) තේ වගාව හා නිෂ්පාදනය, රබර් වගාව හා නිෂ්පාදනය සහ පොල් වගා කර්මාන්තය පමණක් මෙයට අඩංගු වේ.

(ආ) පොල් නිෂ්පාදනය, ඉංජිනේරු, මුද්‍රණ කටයුතු, ගිනිකූරු නිෂ්පාදනය, මෝටර් රථ ප්‍රවාහණය, නැව්-තටාකය, වරාය, වරාය ප්‍රවාහණය, තේ නිර්යාත, රබර් නිර්යාත, චිත්‍රපටි සහ ගොඩනැගිලි කර්මාන්තයන් පමණක් මෙයට අඩංගු වේ.

(ඇ) කෘෂිකාර්මික කම්කරුවන් සහ වාණිජ හා කාර්මික කම්කරුවන් සඳහා ඒකාබද්ධ දර්ශකය.

1969 දී කෘෂිකර්මයෙහි නියුතු කම්කරුවන් සඳහා වූ වැටුප් අනුපාතික දර්ශකය 138·8 හි නොවෙනස්ව පැවතිණ. පළමු කාර්තු තුනේදී 161·6 ක්ව ස්ථායිව පැවති කර්මාන්ත හා වාණිජ අංශයන්හි නියුතු කම්කරුවන් සඳහා දර්ශකය, අවසාන කාර්තුවේදී සුළු වශයෙන් ඉහළ නැගිණි. 1968 අංක 40 දරන සේවකයින්ගේ අතුරු අවප්‍රමාණ දීමනා ආඥා පනතේ[1] 4 (1) වගන්තිය අනුව, මුද්‍රණ කර්මාන්තයේ නියුතු සමහර කම්කරු කොටස්වලට ඉහළ දීමනාවන් ගෙවීමේ හේතුවෙන් මෙම දර්ශකය ඉහළ ගියේය.

ඉහත දක්වන ලද කම්කරු කොටස්වල, වාර්ෂික සාමාන්‍ය මූර්ත වැටුප් පරිමා දර්ශකයන්, 1969 දී, පෙර වර්ෂයට වඩා පහළ මට්ටමක පැවතුනි. 1969 දී කෘෂිකාර්මික සේවකයින් සඳහා වූ සාමාන්‍ය දර්ශකය 106·3 ක්වූ අතර, ඉකුත් වසරෙහි අනුරූප දර්ශකය 114·3 ක් විය. කර්මාන්ත සහ වාණිජ අංශයන්හි නියුතු කම්කරුවන් සම්බන්ධයෙන් බලන කල 1969 සාමාන්‍ය දර්ශකය 123·9 ක්වූ අතර ඉකුත් වසරේ අනුරූප දර්ශකය 133·1 ක් විය.

වැටුප් ව්‍යුහය සහ සියළුම කොටස්වල සේවකයින්ගේ වැටුප් විෂමතාවයන් පරීක්‍ෂා කිරීම පිණිස, රජය විසින් 1969 දී විශේෂ කාරක සභාවක් පත් කරන ලදී. 1969 දෙසැම්බරයේදී ගරු මුදල් ඇමති තුමා වෙත ඉදිරිපත් කරන ලද වැටුප් පිළිබඳ අතුරු වාර්තාව, එම කමිටුවේ නිර්දේශයන් පිළිබඳව වාතීා කිරීම සඳහා පාර්ලිමේන්තු ලේකම්වරුන් හය දෙනෙකුගෙන් යුත් කාරක සභාවකට ඉදිරිපත් කරනු ලැබිය. හමුදා සේවාවන්හි වැටුප්, සේවයේ යෙදී සිටින්නන්ගේ දීමනාවන් හා සේවා කොන්දේසි පිළිබඳව සොයා බැලීම සඳහා දෙසැම්බරයේදී, රජය මගින් කාරක සභාවක් පත් කරන ලදී.

14·3·69 දින සිට ටයර් හා ටියුබ් නිෂ්පාදනයෙහි යෙදී සිටින කම්කරුවන් හා ටයර් පිරවීමේ සහ ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනයෙහි යෙදී සිටින අය සඳහා නව වැටුප් පාලක මණ්ඩලයක් පිහිටුවන ලදී. මෙම මණ්ඩලය පිහිටුවීමත් සමග මුළු වැටුප් පාලක මණ්ඩල සංඛ්‍යාව 30 ක්වූ අතර, ඒ යටතේ සේවකයින් දශලක්‍ෂ 1·5 කට වැඩි ප්‍රමාණයක් වූහ. සම් පදම් කිරීමේ ද, පාවහන් හා සම්භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තවල නියුතු සේවකයින් සඳහා වැටුප් මණ්ඩලයක් පිහිටුවීමට දැනටමත් පියවර ගෙන තිබේ.

1969 සැප්තැම්බර් මස 1 වැනි දින සිට සුරුට්ටු නිෂ්පාදන කර්මාන්තයෙහි කොටස් වැඩ සඳහා, අවම වේතන අනුපාතිකය සුරුට්ටු 1000 කට රුපියල් 10·00 සිට රු. 13·00 දක්වා වැඩි කර ඇත.

1969 ජූනි 1 වැනි දින සිට බේකරි කර්මාන්තයේ සියළුම වර්ගවල සේවකයන් සඳහා මාසික මූලික වැටුප රු. 15/= කින් වැඩි කරනු ලැබිය. ජූනි 1 දිනට පෙර "ඒ" වර්ගයේ සේවකයන්ට රු. 70/= ක්ද, "බී" වර්ගයේ සේවකයන්ට රු. 55/= ක්ද "සී" වර්ගයේ සේවකයන්ට රු. 39/= ක්ද ආදී වශයෙන් අවම වැටුප් ගෙවන ලදී.

කොළඹ නගරයෙහි වූ සමහර සාප්පු සහ හෝටල්වල සේවකයින්ගේ අවම වැටුප් අනුපාතිකයන් 1969 දී නිගමනය කරන ලද්දේ වේතන උසාවි[2] මගිනි; මෙම නිගමනයන් ක්‍රියාත්මක වූයේ, පිළිවෙලින් ජූනි 1 වැනිදා සිට හා දෙසැම්බර් 1 වැනිදා සිටය.

---

1. මෙම ආඥා පනත යටතේ සේවකයින් වෙත, අවප්‍රමාණ දීමනාවක් ඇතුළු ජීවන වියදම් දීමනාවක් හෝ 1967 දෙසැම්බරයෙහි වටිනාකම් අනුව විශේෂ දීමනාවක් හෝ ගෙවනු ලබයි. තවද මෙම ආඥා පණතේ විධිවිධානයන්ට අනුව, කිසියම් විටෙක, ජීවන වියදම් දීමනාව හෝ ජීවන වියදම් දර්ශකය අනුව ගෙවනු ලබන විශේෂ දීමනාව හෝ මෙම පනත යටතේ ගෙවිය යුතු දීමනාවන්ගේ එකතුව ඉක්මවුවහොත්, මෙම අතිරික්තය ලැබීමට සේවකයින් සුදුස්සෝ වෙති. ජීවන වියදම් දර්ශකය ඉහළ යාම නිසා, 1969 දී මුද්‍රණ ශිල්පී සේවයෙහි නියුතු සේවකයින්ට ගෙවිය යුතුවූ විශේෂ දීමනාව, මෙම ආඥා පණත යටතේ ගෙවන ලද දීමනාවන්ට වඩා වැඩි විය.

2. වැටුප් පාලක සභාවන් යටතට පත් නොවන සේවකයින්ගේ අවම වැටුප් අනුපාතිකයන් නිගමනය කිරීම සඳහා සාප්පු සහ කාර්යාල සේවක පනත (129 පරිච්ඡේදය) යටතේ කම්කරු ඇමතිතුමා විසින් වේතන උසාවි පත් කරනු ලැබේ.